# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR)

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රජයේ සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ ආධාර මත ක්‍රියාත්මක වන කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ (STaRR) කොළඹ පිහිටි ව්‍යාපෘති කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්වලින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ව්‍යාපෘති තොරතුරු

අම්පාර, මොනරාගල, බදුල්ල, ගාල්ල, මාතර, මහනුවර, නුවරඑළිය සහ රත්නපුර ව්‍යාපෘති ප්‍රදේශ වේ. ව්‍යාපෘති කාලසීමාව වසර 06 කි. (2016-2021) ව්‍යාපෘතියේ පරමාර්ථ වන්නේ, ව්‍යාපෘති ප්‍රදේශවල සිටින කුඩා තේ හා රබර් වතු හිමියන්ගේ වඩා ඵලදායී, ලාභදායී සහ ස්ථාවර ආර්ථික ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමයි. ව්‍යාපෘති සංරචකයන් වන්නේ, (අ) කුඩා තේ වතු හිමියන් සංවර්ධනය (ආ) කුඩා රබර් වතු හිමියන්ගේ සංවර්ධනය (ඇ) ග්‍රාමීය මූල්‍ය (ඈ) ව්‍යාපෘති කළමනාකරණය.

## 01. ව්‍යාපෘති ගණකාධිකාරී - තනතුරු - 01
**(කාර්යාලය - කොළඹ) (PS 4)**

**රැකියා විස්තරය :**

- ව්‍යාපෘතියේ කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අරමුදල් පවතින බව සහතික කිරීම පිණිස වාර්ෂික අයවැය, ප්‍රසම්පාදන සැලසුම් සහ ඒකාබද්ධ අයවැය සකස් කිරීම
- පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ගිණුම්කරණ ප්‍රකාශයන් සකස්කිරීම සහ විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ කලින් කලට සංශෝධනය විය හැකි ව්‍යාපෘති විගණන කටයුතු පිළිබඳ අරමුදල් මාර්ගෝපදේශයන්ට අනුකූලව විගණකාධිපති විසින් විගණනය කිරීම සඳහා වැඩසටහනට අදාළ එම මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම.
- කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව විනිවිදභාවයෙන් සහ කාලෝචිතව සියලු ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බවට සහතික වීම.

**අවශ්‍ය පළපුරුද්ද සහ සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ, කළමනාකරණ, ව්‍යාපාර කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම

    හෝ

    අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම මට්ටමේ විභාගය සමත්වී තිබීම

    සහ

    එම සුදුසුකම සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්දක් ලබා තිබීම.

02. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III/II පන්තියේ හෝ ඉහළ හෝ සමාන තත්ත්වයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.

**වැටුප් :**

- 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව මාසිකව රු. 115,000/-

## 02. අධීක්ෂණ හා ඇගයුම් සමායෝජක - තනතුරු - 01
**(කොළඹ) (PS 4)**

**රැකියා විස්තරය :**

- අධීක්ෂණ සහ ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම
- අධීක්ෂණ සහ ඇගයුම් ආකෘති සකස් කිරීම
- ව්‍යාපෘති කාර්ය සාධනය පිළිබඳව සමාලෝචනය කිරීම සහ වාර්තා කිරීම
- වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ගැටළු පිළිබඳව වැඩසටහන් කළමනාකරණය දැනුවත් කිරීම.

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආර්ථික විද්‍යාව, වාණිජ්‍ය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය, ගණකාධිකරණය, කෘෂිකර්මය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක උපාධියක් සම්පූර්ණ කර තිබීම

    හෝ

    අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් ලබා තිබීම

    හෝ

    අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම

    සමග

    එම සුදුසුකම සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්දක් ලබා තිබීම.

02. රාජ්‍ය සේවයේ දීපව්‍යාප්ත සේවාවක සේවයේ III/II පන්තියේ හෝ ඉහළ හෝ සමාන තත්ත්වයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.

**වැටුප් :**

- 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව මාසිකව රු. 115,000/-

## 03. ව්‍යාපාර සංවර්ධන නිලධාරී - තනතුරු - 01
**(ගාල්ල) (PS 5)**

**රැකියා විස්තරය :**

- පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ පාර්ශවකරුවන් සමග තිරසාර සම්බන්ධීකරණය.
- තේ සහ රබර් ක්ෂේත්‍රයේ තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ආදර්ශ ව්‍යාපාර ආරම්භ කිරීම / සැලසුම් කිරීම / සංවිධානය කිරීම / යොමු කිරීම සහ අධීක්ෂණය කිරීම.
- අදාළ සංවිධාන හරහා ප්‍රතිලාභීන් වෙත තාක්ෂණික සහ මූල්‍ය මාර්ගෝපදේශයන් ලබාදීම.
- සුදුසු ආදර්ශ ව්‍යාපාර හඳුන්වාදීම මගින් ප්‍රතිලාභීන් අතර ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහතික කිරීම.
- කුඩා තේ වතු සහ රබර් වතු හිමියන් අතර ව්‍යාපාරික කටයුතු වැඩිදියුණු කිරීම සඳහා විපර්ය කාරකයෙක් වශයෙන් ක්‍රියාකිරීම සහ මග පෙන්වීම.

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආර්ථික විද්‍යාව, වාණිජ්‍ය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය, ගණකාධිකරණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම

    හෝ

    තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 07 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

    සහ

    විශේෂඥභාවය අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

02. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 06 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

    සහ

    විශේෂඥභාවය අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද.

03. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 05 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

    සහ

    විශේෂඥභාවය අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද.

**වැටුප් :**

- 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව මාසිකව රු. 85,000/-

## 04. ප්‍රජා සංවර්ධන නිලධාරී - තනතුරු - 01
**(ගාල්ල) (PS 5)**

**රැකියා විස්තරය :**

- ග්‍රාමීය ප්‍රජාව වෙත පුහුණුව සහ හැකියා වර්ධනය ලබාදෙමින් ගොවි කණ්ඩායම් පිහිටුවීම

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මානව සම්පත් සංවර්ධන, ආර්ථික විද්‍යාව, කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක උපාධියක් සම්පූර්ණ කර තිබීම

    හෝ

    අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් ලබා තිබීම

    හෝ

    අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම

    හෝ

    තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 07 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග

    අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 06 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. සමග

    අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද.

03. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 05 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සමග

    අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද.

**වැටුප් :**

- 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව මාසිකව රු. 85,000/-

## 05. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී - තනතුරු - 01 (කොළඹ) (PS 5)

**රැකියා විස්තරය :**

- ව්‍යාපෘති සංරචකයන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සහ රජයේ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (GMIS) ස්ථාපිත කිරීම.
- ව්‍යාපෘති දත්ත සමුදයන් (තේ, රබර් සහ ග්‍රාමීය මූල්‍ය සඳහා), වෙබ් අඩවිය සහ විද්‍යුත් තැපැල පද්ධතිය ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.
- ව්‍යාපෘතියේ පරිගණක උපකරණ, ව්‍යාපෘති ජාලය සහ පරිගණක පද්ධතියේ එදිනෙදා නඩත්තු කටයුතු සිදුකිරීම.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහ දිස්ත්‍රික් ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල පරිගණක මෘදුකාංග ප්‍රසම්පාදනය සහ පවත්වාගෙන යාම සඳහා සහාය දැක්වීම.
- ව්‍යාපෘති දත්ත සහ තොරතුරු පරිශීලකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් සඳහා පරිශීලක මිත්‍ර පරිසරයක් පවත්වාගෙන යාම.
- කළමනාකරණ තොරතුරු පද්ධතිය / රජයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS/GMIS) සහ දත්ත රැස් කිරීම පිළිබඳව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රගති වාර්තා, කාර්තු වාර්තා හා වාර්ෂික වාර්තා යනාදිය ලේඛනගත කිරීම.

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය / පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක උපාධියක් සම්පූර්ණ කර තිබීම

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් ලබා තිබීම

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම

**හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 07 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද

02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 06 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද.

03. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 05 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද.

**වැටුප් :**

- 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව මාසිකව රු. 85,000/-

### වෙනත් ප්‍රතිලාභ :

- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා පිළිවෙලින් 12% ක සහ 3% ක දායකත්වයක් රජය මගින් ගෙවනු ලබන අතර, සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ වැටුපෙන් 8% ක දායකත්වයක ලබාදිය යුතුය.

### සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

- කොන්ත්‍රාත් පදනම මත සියලුම බඳවාගැනීම් සිදුකරනු ලබන අතර, සතුටුදායක කාර්ය සාධන ඇගයීම්වලට යටත්ව වාර්ෂිකව සේවා කාලය අලුත් කළ හැකිය. සේවා කාලය දීර්ඝ කිරීම් කාර්ය සාධනය මත පදනම්ව සලකා බලනු ලැබේ.
- වයස අවුරුදු 65 ට අඩු විය යුතුය.

සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු පිළිබඳව සියලු විස්තර සහ තමන් පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ ඇමතිය හැකි දුරකථන අංක සඳහන් කරන ලද අයදුම්පත්‍ර, අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කොට 2018.06.24 දින හෝ ඊට පෙර **ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, 11 වන මහල, සෙත්සිරිපාය, 2 වන අදියර, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතිකපත්වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථාවල, මණ්ඩලවල, අධිකාරිවල සහ ව්‍යාපෘතිවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එහිදී 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ අදාළ වගන්තිය ප්‍රකාරව, අයදුම්කරු සේවයෙන් මුදාහැරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

ලැබෙන අයදුම්පත් තේරීමකට භාජනය කරනු ලබන අතර, සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය පිළිබඳ වැඩිමනත් තොරතුරු සහ ඉහත තනතුරු පිළිබඳ විස්තර www.plantationindustries.gov.lk යන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.**